# මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය
# நிதி, திட்டமிடல் மற்றும் பொருளாதார அபிவிருத்தி அமைச்சு
# MINISTRY OF FINANCE, PLANNING AND ECONOMIC DEVELOPMENT

| | | |
|---|---|---|
| මහලේකම් කාර්යාලය, කොළඹ 01,<br>ශ්‍රී ලංකාව. | செயலகம், கொழும்பு 01.<br>இலங்கை. | The Secretariat, Colombo 01.<br>Sri Lanka. |
| කාර්යාලය / அலுவலகம் / Office: 011 - 2484500, 011 - 2484600, 011 - 2484700 | ෆැක්ස් / தொலைநகல் / Fax: 011 - 2449823 | වෙබ් අඩවිය / இணையத்தளம் / Website: www.treasury.gov.lk |


| | | |
|---|---|---|
| මගේ අංකය / எனது இல. / My No.: SAD/ITMIS/01/16/General | ඔබේ අංකය / உமது இல. / Your No.: | දිනය / திகதி / Date: 2025.07.17 |

රාජ්‍ය ගිණුම් චක්‍රලේඛ අංක : 02/2025

සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන්,
දෙපාර්තමේන්තු ප්‍රධානීන්,
දිස්ත්‍රික් ලේකම්වරුන් වෙත.

**<u>භාණ්ඩ හා සේවා ප්‍රසම්පාදනය සඳහා ITMIS පද්ධතිය හරහා ජනනය කරනු ලබන ඇණවුම්පත් භාවිතා කිරීම.</u>**

විනිවිදභාවය හා වගවීම ඉහල නැංවීම මගින් මූල්‍ය විනය ස්ථාපිත කිරීම හා ඵලදායී අයවැය කළමණාකරණයක් සිදුකිරීම සඳහා බැදීම් පාලනය සැලකියයුතු කාර්යභාරයක් ඉටුකරනු ලබයි. හිඟ ගෙවීම් ඉහලයාම පාලනය හා මූල්‍ය වාර්තාකරණයේ නිරවද්‍යතාවය වැඩිදියුණු වීම මෙන්ම මනා මූල්‍ය සැලසුම්කරණය, පුරෝකථනය හා අනාගත බැදියාවන් අධීක්ෂණය යන කරුණු, බැදීම් හඳුනා ගැනීම හා වාර්තාකිරීමේ හැකියාව තුලින් සහතික වනු ඇත. රජයේ රාජ්‍ය මූල්‍ය කළමනාකරණ ප්‍රතිසංස්කරණ තුල අඩංගු කාර්යක්ෂම බැදීම් පාලනය සහ හිඟ ගෙවීම් කළමනාකරණ ක්‍රමවේද, 2024 අංක 44 දරණ රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනත මගින් හඳුනාගෙන ඇත. ඒ අනුව රජය විසින් ඒකාබද්ධ භාණ්ඩාගාර කළමනාකරණ තොරතුරු පද්ධතිය (ITMIS) හරහා පද්ධතිගත බැදීම් පාලන හා හිඟ ගෙවීම් කළමනාකරණ කාර්යපටිපාටි ස්ථාපනය කිරීමට කටයුතු කර ඇත.

මේ සඳහා රජයේ සියළුම අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු හා දිස්ත්‍රික් ලේකම් කාර්යාල විසින් **2026.07.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි** භාණ්ඩ හා සේවා ප්‍රසම්පාදනයේදී ITMIS පද්ධතිය හරහා ජනනය කරනු ලබන **ඇණවුම් පත් (Purchase Orders)** පමණක් භාවිතා කිරීම අනිවාර්ය වේ. 2026.07.01 දිනෙන් පසු භාණ්ඩාගාරය විසින් භාණ්ඩ හා සේවා සැපයුම් සඳහා වන ගෙවීම් නිරවුල් කරනු ලබන්නේ (අ) අදාල ඇණවුම් පත් **(Purchase Orders)** ITMIS පද්ධතිය හරහා ජනනය කරන ලද හෝ (ආ) අදාල ඇණවුම් පත් **(Purchase Orders)** ඉහත දිනට පෙර නිකුත් කර එසැනින් ITMIS පද්ධතියට ඇතුලත් කර ඇත්නම් **පමණි**. නියමිත කාලසීමාවට පෙර මේ සම්බන්ධයෙන් සැපයුම්කරුවන් හා සේවා සපයන්නන් දැනුවත් කිරීමට අවශ්‍ය පියවර ගැනීමට භාණ්ඩාගාරය විසින් කටයුතු කරනු ඇත.

තවද 2025.09.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි ITMIS පද්ධතියෙන් පරිබාහිරව අතින් පිළියෙල කරන ලද හෝ වෙනත් පද්ධතියක් හරහා නිකුත් කරන ලද ඇණවුම් පත්, භාණ්ඩාගාරයට හිඟ ගෙවීම් දත්ත ලබා ගැනීමට හැකි වන පරිදි එය නිකුත් කර දින සිට **දින 15 ක් ඇතුලත** ITMIS පද්ධතිය වෙත ඇතුලත් කිරීම සිදු කල යුතුය. එසේම ඉදිරියේදී ලබා දෙනු ලබන උපදෙස් වල දක්වා ඇති ආකාරයට ඉහත සඳහන් ඇණවුම් පත් මත ලැබෙන ඉන්වොයිස්පත් ලැබී **දින 15 ක් ඇතුලත** ඊට අනුකූලව පිළයෙල කරනු ලබන **වියදම් වවුචර්පත් (Expense vouchers)** ITMIS පද්ධතියට ඇතුලත් කල යුතුය. අදාල පරිවර්තනය සුමටව සිදුකිරීම සඳහා ඇණවුම් පත් හා වියදම් වවුචර ITMIS පද්ධතිය තුල සටහන් කිරීම සම්බන්ධයෙන් ඔබ කාර්යමණ්ඩලයට අවශ්‍ය වන පුහුණුව අදාල දිනට පෙර ලබා දීමට කටයුතු කරනු ඇත.

මුදල් අමාත්‍යාංශයේ සම්බන්ධීකරණය හා මඟපෙන්වීම යටතේ සියළුම අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු හා දිස්ත්‍රික් ලේකම් කාර්යාල විසින් 2026.07.01 දින සිට ක්‍රියාවට නංවන මෙම වෙනස්කම් පිළිබඳව තම ලියාපදිංචි සැපයුම්කරුවන් දැනුවත් කිරීමට අවශ්‍ය සුදුසු ක්‍රියාමාර්ග ගැනීම සිදුකල යුතුය.

රාජ්‍ය ව්‍යාපාර, පළාත් සභා හා පළාත් පාලන ආයතන වල ප්‍රසම්පාදනයන් සඳහා මෙම විධිවිධානයන් අදාල **නොවේ.**

මේ සම්බන්ධයෙන් අවශ්‍ය සහය ඊ මේල් ලිපිනය - kumara.wrj@sad.treasury.gov.lk මඟින් අධ්‍යක්ෂ - ITMIS සහ සහායක සේවා හෝ ඊ මේල් ලිපිනය - wewalage.lp@ sad.treasury.gov.lk නියෝජ්‍ය අධ්‍යක්ෂ මඟින් ලබාගත හැකිය.

ආචාර්ය හර්ෂන සූරියප්පෙරුම
ලේකම්
මුදල් ක්‍රමසම්පාදන හා ආර්ථීක සංවර්ධන අමාත්‍යාංශය

පිටපත - විගණකාධිපති